# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1992/47 - 2016 නොවැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්ද - 2016.11.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : EMDS/LND/06/ACQ/02/12.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2013/WS/489.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දියපොතගම් පත්තුව සුලු කොට්ඨාසයේ , පනාමුර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද, 2016.06.23 දිනැති ගම් පිඹුරු අංක 753 අතිරේක අංකය 43 හා පත්‍ර අංක 43 දරන පිඹුරේ කැබලි අංක 1075 වශයෙන් දක්වෙන වෙහෙරගාවමුකලාන නැමති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0212ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

**කැබලි අංක 1075**

ඉඩමේ නම: වෙහෙරගාවමුකලාන; ඉඩමේ විස්තරය:-; හිමිකම් කියන අය: ආර්. කේ. ජයලත් මහතා, වැ අතුර, පනාමුරේ; ප්‍රමාණය: හෙක්. 0.0212.

*උතුරට* : කැබලි අංක 402; *නැගෙනහිරට* : කැබලි අංක 402, 1070 සහ 1066; *දකුණට* : කැබලි අංක 402, 1070, 1066 සහ 1065; *බටහිරට* : කැබලි අංක 1065 සහ 402.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් කියන අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කර සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 දෙසැම්බර් මස 28 වන දින පෙ. ව. 10.00ට ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2016 දෙසැම්බර් මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

වසන්ත ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
ඇඹිලිපිටිය.

2016 නොවැම්බර් මස 07 වැනි දින,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 1138



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : ටීඑච්අයි/එල්එන්ඩී/එල්2/ඒසීකිව්වීඅයි/133.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/6/2015/එච්ඩබ්/268.

අංක 1988/11 හා 2016 ඔක්තෝබර් මස 10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පී. කේ. සී. එන්. මහින්දඥාන, ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරි, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, තංගල්ල යනුවෙන් වැරදි ලෙස සඳහන් වී ඇත. එබැවින් එය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බව දන්වමි.

පී. කේ. සී. එන්. මහින්දඥාන,
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරි,
තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2016 නොවැම්බර් මස 09 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 1139

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : ව/18/56/2001/IV.

වර්ෂ 2010 ක්වූ මාර්තු මස 16 වෙනි දින අංක 1645/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීමේ සඳහන් මූලික පිඹුරු අංකය ගම් 3716 දරන පිඹුරේ කැබලි අංක 30, කැබලි අංක 117, 118, 119, 120, 121 සහ 122 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දී සිටිමු.

**කැබලි අංක 117**

ඉඩමේ නම: ගුවන් හමුදාවත්ත ; විස්තරය: ගෙවත්ත, අවු 15ක් පමණ වයසැති තැඹිලි ගස් 1ක් සහ දෙල් ගස් 1ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. ඒ. සුමිත් ආනන්ද, මැද්දෙකන්දවත්ත, බලංගොඩ; ප්‍රමාණය:හෙක්. 0.0038.

**කැබලි අංක 118**

ඉඩමේ නම: ගුවන් හමුදාවත්ත; විස්තරය: ගෙවත්ත, අවු 10ක් පමණ වයසැති මහෝගනී ගස් 1ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. ඒ. එස්. එස්. මුණසිංහ, අංක 86/3, ගල්උඩුපිට පාර, රාගම; ප්‍රමාණය:හෙක්. 0.0067.

**කැබලි අංක 119**

ඉඩමේ නම: ගුවන් හමුදාවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. ඒ. ඩී. ඩී. මල්කාන්ති මුණසිංහ, අංක 111, සන්රයිස් මාවත, මත්තුමගල, රාගම; ප්‍රමාණය:හෙක්. 0.0126

**කැබලි අංක 120**

ඉඩමේ නම: ගුවන් හමුදාවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 1ක්, සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් සහ වැසිකිලියක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජී. ඒ. එල්. එස්. නයනා මුණසිංහ, අංක 5, ධර්මදාස මාවත, ඇලපිටිවල, රාගම; ප්‍රමාණය:හෙක්. 0.0038

**කැබලි අංක 121**

ඉඩමේ නම: ගුවන් හමුදාවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 1ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. ඒ. ලක්ෂමන් අතුල, අංක 113, සන්රයිස් මාවත, මත්තුමගල, රාගම; ප්‍රමාණය:හෙක්. 0.0126

**කැබලි අංක 122**

ඉඩමේ නම: ගුවන් හමුදාවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 1ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එච්. කේ. ජගත් චමින්ද, අංක 113, සන්රයිස් මාවත, මත්තුමගල, රාගම; ප්‍රමාණය:හෙක්. 0.0126

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ කැබලි අංක 117-122 දක්වා 2016 දෙසැම්බර් මස 28 වෙනි දින පෙ.ව. 10.00ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 දෙසැම්බර් මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඩබ්ලිව්. ජී. ප්‍රේමලාල්,
ප්‍රාදේශීය ලේකම්.
වත්තල.

2016 නොවැම්බර් මස 02 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-1140

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : මීරි/ප්‍රාලේ/ඉ/3/2016/5.
*ඉඩම් අමාත්‍යාංශ අංකය* : 4-3/7/2016/HW/98.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ 1987/24 හා 2016 ඔක්තෝබර් මස 05 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද හිමිකම් පරීක්ෂණය පැවැත්වෙන දිනය 2016 ඔක්තෝබර් 17 වන දින පෙ. ව. 9.30 වශයෙන් සඳහන් වුව ද, එම දිනය හා වේලාව, 2016 නොවැම්බර් මස 17 වන දින පෙ. ව. 9.00 යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

වයි. අයි. එම්. සිල්වා,
ප්‍රාදේශීය ලේකම්,
මීරිගම.

2016 ඔක්තෝබර් මස 26 වැනි දින,
මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 1141

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.